සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
රැකියා පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **මෙම තනතුරු සඳහා බඳවාගැනීම් කොළඹ ප්‍රධාන කාර්යාලය සඳහා පමණක් සිදු කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

අංකය	තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	සුදුසුකම්
01	අතිරේක සුබසාධක කොමසාරිස් (පාලන) HM -1-1	**01**	**<u>සුදුසුකම් සහ පළපුරුද්ද</u>** **<u>බාහිර අයදුම්කරුවන්:</u>** 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් රාජ්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, නීතිය, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය යන ක්ෂේත්‍රයන්හි උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑ ම උපාධියක්. සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Master's) සුදුසුකමක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) පූර්ණ සාමාජිකත්වය සහ ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු ව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාරී මට්ටමේ" අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද. **<u>අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)</u>** 1. බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම. 2. තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව කළමනාකාර ඛණ්ඩයේ (MM 1-3) තනතුරක අවම වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Master's) සුදුසුකමක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) පූර්ණ සාමාජිකත්වය **වැටුප් පරිමාණය:** - HM 1-1 - 2025 රු. [140,640 - 15 x 4,100 - 202,140]

			මූලික වැටුප් පියවර: - රු. 123,019/- (අංක 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව) (අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම්) **<u>කාර්යයන් සහ වගකීම්</u>** • මණ්ඩලයේ ජාතික මෙහෙවර ඉටු කිරීම සඳහා අවශ්‍ය මානව ප්‍රාග්ධනය, නීතිමය රාමුව සහ භෞතික යටිතල පහසුකම් පවතින බව තහවුරු කිරීම. • විධායක මානව සම්පත් උපායමාර්ග: කාර්යය පටිපාටි සංග්‍රහයට (MOP) අනුකූල ව, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සියලු ම කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්, කාර්ය සාධන කළමනාකරණය සහ විනය පාලනය අධීක්ෂණය කිරීම. • ආයතනික පාලනය: මණ්ඩලයේ තීරණ පරිපාලන චක්‍රලේඛ බවට පත් කිරීම සඳහා කොමසාරිස්වරයා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය අතර ප්‍රධාන සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම. • නීතිමය සහ ව්‍යවස්ථාපිත අනුකූලතාව: ආයතනික කටයුතු ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයට (Establishment Code) සහ කම්කරු නීතිවලට අනුකූල වන බවට වගබලා ගැනීම. • ප්‍රසම්පාදනය ඇතුළු ව වත්කම් අධීක්ෂණය: සම්පත් අත්පත් කරගැනීම සඳහා වන උසස් මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවල සභාපතිත්වය දැරීම. • ධාරිතා සංවර්ධනය: ශ්‍රම බලකාය නව්‍යකරණය / නූතනකරණය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. • සභාපතිවරයා / කොමසාරිස්වරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑ ම රාජකාරීන්
02	අතිරේක සුබසාධක කොමසාරිස් (මුදල්) HM - 1-1	**01**	**<u>සුදුසුකම් සහ පළපුරුද්ද</u>** **<u>බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)</u>** 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය, වාණිජ්‍යය, ව්‍යාපාර අධ්‍යයනය යන ක්ෂේත්‍රයන්හි උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑ ම උපාධියක්. සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Master's) සුදුසුකමක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership). සහ ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු ව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාරී මට්ටමේ" අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද. 2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institution) පූර්ණ ජ්‍යෙෂ්ඨ (Fellow) සාමාජිකත්වය සහ ප්‍රථම උපාධිය (හෝ අදාළ සුදුසුකම) ලැබීමෙන් අනතුරුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාරී මට්ටමේ" අවම වශයෙන් වසර දහ තුනක (13) පළපුරුද්ද.

			<u>අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)</u> 1. බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම 2. තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව කළමනාකාර ඛණ්ඩයේ (MM 1-3) තනතුරක අවම වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Master's) සුදුසුකමක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) පූර්ණ සාමාජිකත්වය **වැටුප් පරිමාණය:** - HM 1-1 - 2025 රු. [140,640 - 15 x 4,100 - 202,140] මූලික වැටුප් පියවර: - රු. 123,019/- (අංක 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව) (අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම්) **<u>කාර්යයන් සහ වගකීම්</u>** • සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අරමුණු සහ කාර්යයන් සම්බන්ධීකරණය කරමින් ඊට අදාළ අවශ්‍ය ගිණුම්කරණ සහ ගෙවීම් කටයුතු, මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සිදු කිරීම • මූල්‍ය අංශයේ සමස්ත අධීක්ෂණය • අධික වටිනාකමකින් යුත් වවුචර (Vouchers) සහ මුදල් ප්‍රතිපාදන ඉල්ලීම් අවසාන වශයෙන් සමාලෝචනය කිරීම • මාසික වියදම් වාර්තා (WBB සහ අස්වැසුම) අනුමත කිරීම සහ සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ (WBB) හා අස්වැසුම වැඩසටහන් සඳහා ප්‍රමාණවත් අරමුදල් පවතින බවට තහවුරු කිරීම • වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදන සැලසුම් අධීක්ෂණය කිරීම • අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම (Final Accounts) අධීක්ෂණය කිරීම • IWMS පද්ධතියට අදාළ කරුණු ඉහළ මට්ටමින් නිරීක්ෂණය සහ අධීක්ෂණය කිරීම • මුදල් අමාත්‍යාංශය, භාණ්ඩාගාරය සහ අදාළ බලධාරීන් සමඟ සමස්ත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම • මුදල් රෙගුලාසි (FR) 66 සහ 69 ප්‍රතිපාදන මාරු කිරීම් අධීක්ෂණය කිරීම • සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය (WBB), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සහ විදේශීය ආයතන වෙත වාර්තා ඉදිරිපත් කිරීම අධීක්ෂණය කිරීම • තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ (RTI) පනතට අනුව මූල්‍ය තොරතුරු නිලධාරියා ලෙස කටයුතු කිරීම • දායකයන්ගේ (Donor) වාර්තාකරණ යාන්ත්‍රණයන් නිරීක්ෂණය කිරීම

			• ආයතනය පුරා අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම • මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලය අතර තැපැල් ලිපි බෙදා හැරීම • ඔබගේ වාර්තාව සමඟ දත්ත උපස්ථ (Backups) පවත්වාගෙන යාම • තොරතුරු තාක්ෂණ මූල්‍ය පාලන පද්ධති (IT financial control systems) හඳුන්වා දීම / සමාලෝචනය කිරීම • සභාපතිවරයා / කොමසාරිස්වරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරි
03	අතිරේක සුබසාධක කොමසාරිස් (මෙහෙයුම්)	**01**	**<u>සුදුසුකම් සහ පළපුරුද්ද</u>** **<u>බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)</u>** **1.** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, මුදල් (Finance), රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, නීතිය, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවේදය, තොරතුරු පද්ධති, IT ඉංජිනේරුවේදය යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑ ම උපාධියක් ලබා තිබීම. සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම (Masters') හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම. සහ ප්‍රථම උපාධිය ලැබීමෙන් පසුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාරී මට්ටමේ" අවම වශයෙන් වසර දහ තුනක (13) පළපුරුද්ද. 2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institution) පූර්ණ ජ්‍යෙෂ්ඨ (Fellow) සාමාජිකත්වය සහ ප්‍රථම උපාධිය ලැබීමෙන් පසුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාරී මට්ටමේ" අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද. **<u>අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)</u>** 1. බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම **2.** තනතුරේ විෂය ක්ෂේත්‍රය අදාළ ව කළමනාකාර බණ්ඩයේ (MM1-3) තනතුරක අවම වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Master's) සුදුසුකමක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) පූර්ණ සාමාජිකත්වය වැටුප් පරිමාණය: - HM 1-1 - 2025 රු. [140,640 - 15 x 4,100 - 202,140]

			මූලික වැටුප් පියවර: - රු. 123,019/- (අංක 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව) (අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම්) **<u>කාර්යයන් සහ වගකීම්</u>** • ප්‍රතිපත්ති සහ උපායමාර්ග: සුබසාධන ප්‍රතිපත්ති සකස් කිරීම සහ සංශෝධනය කිරීම, රෙගුලාසි කෙටුම්පත් කිරීම, සහ ප්‍රතිලාභීන් තේරීම හා ප්‍රතිලාභ බෙදා හැරීම සඳහා වන උපායමාර්ගික ඉලක්ක තීරණය කිරීම. • මෙහෙයුම් කළමනාකරණය: ආයතනයේ කටයුතු සුමටව පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා දෛනික මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම සහ ප්‍රධාන තීරණ ගැනීම. • ක්‍රියාවලි වැඩිදියුණු කිරීම: උපරිම කාර්යක්ෂමතාවයක් ලබා ගැනීම සඳහා මෙහෙයුම් පටිපාටීන් අඛණ්ඩ ව ඇගයීම සහ ඉහළ නැංවීම. • පාර්ශ්වකරුවන්ට මඟ පෙන්වීම: මෙහෙයුම් කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ බාහිර පාර්ශ්වකරුවන් මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම. • අභ්‍යන්තර සම්බන්ධීකරණය: කාර්ය ප්‍රවාහයන් බාධාවකින් තොර ව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර අංශ සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම. • නියෝජනය: මණ්ඩල, අමාත්‍යාංශ සහ ලෝක බැංකු රැස්වීම්වල දී ප්‍රධාන මෙහෙයුම් නියෝජිතයා ලෙස කටයුතු කිරීම. • පෙනී සිටීම සහ සහයෝගය ලබා ගැනීම: සුබසාධන වැඩසටහන් පිළිබඳ ව දැනුවත්භාවය ඇති කිරීම සහ සක්‍රීය සහයෝගය ලබා ගැනීම සඳහා දේශපාලන, පරිපාලන සහ ප්‍රජා නායකයින් සමඟ සක්‍රීය ව කටයුතු කිරීම. • තොරතුරු තාක්ෂණ නායකත්වය: සුභසාධන ප්‍රතිලාභ ඒකාබද්ධ කළමනාකරණ පද්ධතිය (IWMS) අධීක්ෂණය කිරීම සහ තොරතුරු තාක්ෂණ ඒකකයේ ක්‍රියාකාරකම් විධිමත් කිරීම. • දත්ත කළමනාකරණය: සමාජ ආරක්ෂණ තොරතුරු ලේඛනය (Social Protection Information Registry) කළමනාකරණය කිරීම සහ සමාජ සුබසාධන යෝජනාක්‍රම සඳහා රාජ්‍ය අංශයේ විවිධ මට්ටම් අතර එහි භාවිතය සම්බන්ධීකරණය කිරීම. • සභාපතිවරයා /කොමසාරිස්වරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑ ම රාජකාරීන්
04	අතිරේක සුබසාධක කොමසාරිස් (අධීක්ෂණ හා ඇගයීම්) HM -1-1	**01**	**<u>සුදුසුකම් සහ පළපුරුද්ද</u>** **<u>බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)</u>** 1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, සංවර්ධන අධ්‍යයනය, සංඛ්‍යානය, දත්ත විද්‍යාව (Data Science), රාජ්‍ය පරිපාලනය යන ක්ෂේත්‍රවලට අදාළ උපාධියක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් ඕනෑ ම උපාධියක් ලබා තිබීම. සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම (Masters') හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම. සහ

			ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු ව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාරී මට්ටමේ" අවම වශයෙන් වසර දහ තුනක (13) පළපුරුද්ද. **2.** තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institution) පූර්ණ ජ්‍යෙෂ්ඨ (Fellow) සාමාජිකත්වය සහ ප්‍රථම උපාධිය ලැබීමෙන් පසු ව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාරී මට්ටමේ" අවම වශයෙන් වසර දහ තුනක (13) පළපුරුද්ද **<u>අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)</u>** **1.** බාහිර අයදුම්කරුවන් සඳහා ඉහතින් සඳහන් කරන ලද අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම **2.** තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව කළමනාකාර ඛණ්ඩයේ (MM1-3) තනතුරක අවම වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Master's) සුදුසුකමක් හෝ තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ ව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (Chartered Institute) පූර්ණ සාමාජිකත්වය වැටුප් පරිමාණය: - HM 1-1 - 2025 රු. [140,640 - 15 x 4,100 - 202,140] මූලික වැටුප් පියවර: - රු. 123,019/- (අංක 2025/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ II වන උපලේඛනයට අනුව) (අනුමත රජයේ දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛයන්ට අනුකූල ව සන්නිවේදන පහසුකම්) **<u>කාර්යයන් සහ වගකීම්</u>** • වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීමට නායකත්වය දීම සහ කොමසාරිස්වරයා වෙත කාර්යසාධන වාර්තා සකස් කිරීම උදෙසා ප්‍රගතිය පිළිබඳ පුළුල් සමාලෝචනයන් පැවැත්වීම. • විමධ්‍යගත මෙහෙයුම් කටයුතු ජාතික උපායමාර්ගික ඉලක්කයන් හා අනුගත වන බව තහවුරු කරමින්, දිස්ත්‍රික් මට්ටමේ සුබසාධන වැඩසටහන්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම. • නිල ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන්, අදාළ ආයතන වෙත තහවුරු කරන ලද තොරතුරු, දත්ත සහ සංඛ්‍යාලේඛන ලබා දීමේ ප්‍රධාන බලධාරියා ලෙස කටයුතු කිරීම. • ස්ථාපිත ප්‍රධාන කාර්යසාධන දර්ශකයන්ට (KPIs) අනුව ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා වැඩසටහන් තොරතුරු රැස්කිරීම අධීක්ෂණය කිරීම. • වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටලු / ගැටලුකාරී තත්ත්වයන් හඳුනා ගැනීම සහ ඒවා විසඳීම සඳහා වන යෝජනා කෙටුම්පත් කිරීම. • සමාජීය සහ ආර්ථික ප්‍රතිඵල මැන බැලීම සඳහා දත්ත මත

			පදනම් වූ විශ්ලේෂණයන් භාවිතා කරමින් සුබසාධන වැඩසටහන්වල සමස්ත සඵලතාවය පිළිබඳ වාර්තා කිරීම. • ප්‍රතිපෝෂණ ලබා ගැනීමට සහ වැඩසටහන්වල පාරදෘශ්‍ය භාවය වැඩි දියුණු කිරීමට සියලු ම අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩ සන්නිවේදනයක් පවත්වා ගෙන යාමට පහසුකම් සැලසීම. • සුබසාධන වැඩසටහන්වල දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කිරීම සඳහා තිරසාරභාවය පිළිබඳ වාර්තාකරණය සහ ඉහළ මට්ටමේ දත්ත විශ්ලේෂණයන් මෙහෙයවීම. • දැනට පවතින තේරීම් නිර්ණායක හේතුවෙන් යම් අගතියට පත් වූ කණ්ඩායම් බැහැර වී ඇත්නම්, ඊට බලපෑ මූලික හේතු විශ්ලේෂණය කිරීම; තේරීම්වල නිවැරදිතාව ඉහළ නැංවීම සඳහා නව දර්ශක සහ මානයන් පිළිබඳ යෝජනා සකස් කර ඉදිරිපත් කිරීම • වැඩසටහන්වල ප්‍රතිදානයන් නිරීක්ෂණය කිරීමට සහ අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට කළමනාකාරිත්වයට සහාය වීම සඳහා සම්මත නිරීක්ෂණ හා ඇගයීම් මෙවලම් සහ ක්‍රමවේදයන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. • සභාපතිවරයා / කොමසාරිස්වරයා විසින් පවරනු ලබන වෙනත් ඕනෑ ම රාජකාරීන්

වයස් සීමාවන්:

<u>අතිරේක සුබසාධක කොමසාරිස්-</u>

වයස අවුරුදු 35 ට නො අඩු සහ අවුරුදු 55 ට නො වැඩි විය යුතු ය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

සාමාන්‍ය කොන්දේසි:

❖ වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් රජයේ දායකත්වය ලෙස 12% ක් ගෙවනු ලැබේ. තව ද, සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක දායකත්වයක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

❖ පත්වීම් සිදු කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව ය.

❖ . මෙම තනතුරු ස්ථිර වේ. තනතුරුවල ස්ථිර කිරීමට පෙර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

මාසික වේතනය:

❖ HM 1-1 - 2025 රු. [140,640 - 15 x 4,100 - 202,140] + රජය විසින් අනුමත දීමනා

වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් රජයේ දායකත්වය ලෙස 12% ක් ගෙවනු ලැබේ. තව ද, සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක දායකත්වයක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

අයදුම්පත පහත සඳහන් වෙබ් අඩවිවලින් බාගත කරගත හැක:

❖ http:// www.treasury.gov.lk/web/ministry-of-finance/vacancies

❖ https:// www.wbb.gov.lk/web/si/jobs

- අයදුම්පත ඇතුළත් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, එය .....**2026.10.06....** **දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ. ආර්. ජයවර්ධන කේන්ද්‍රය, අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07."** යන ලිපිනයට යොමු කළ යුතු ය.

- රාජ්‍ය / සංස්ථා අංශයේ ආයතනවල අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ අවසාන දිනයට පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම් කරන්නේ නම්, **එක් එක් තනතුර සඳහා සහතික පත්‍රවල පිටපත් සමඟ වෙන වෙන ම කවරවල බහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය**.

- මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම (shortlisting) සම්බන්ධ සියලු ම හිමිකම් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිවරයා සතු වේ.

කොමසාරිස්
සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.